# ප්‍රධාන ලේකම්කාර්යාලය - වයඹ පළාත
## பிரதானசெயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
## Chief Secretary's Office – North Western Province

පළාත්සභා කාර්යාල සංකීර්ණය,කුරුණෑගල - மாகாணசபை அலுவலகத் தொகுதி, குருநாகல் -Provincial Council Office Complex, Kurunegala.

**මූල්‍ය කළමනාකරණ අංශය**
நிதிமுகாமைத்துவபிரிவு
Financial Management Division


මගේඅංකය / எனது இலக்கம் / My No } NWP/CS/F/35/3/ii

ඔබේඅංකය / உமது இலக்கம் / Your No }

දිනය / திகதி / Date } 2023. 08. 31

වයඹ ආණ්ඩුකාරවර ලේකම්,
සභා ලේකම්,වයඹ පළාත් සභාව,
ලේකම්,වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් සහ
සියළුම ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් වෙත.

**<u>ප.මු.රි.34 - මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කිරීම</u>**

වැඩක මුළු පිරිවැය ඇස්තමේන්තුව ඉක්මවා වියදම් දැරීමට සිදුවන බව පෙනී යන විට එකී සමස්ථ පිරිවැය වැඩිකිරීම සඳහා ප.මු.රි.34.2 පරිදි අධිකාරි බලය ලබාගත යුතුය. එහෙත් මේ සඳහා මේ වන විට භාවිතා කරනුයේ මීට වසර 15 කට පෙර එනම් 2008 වර්ෂයේදී පනවන ලද මූල්‍ය සීමාවන් වන අතර එම සීමාවන් වර්තමාන මිල මට්ටම් හා සැසදීමේදී කිසිසේත් ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වේ. එබැවින් ප.මු.රි.34.2 යටතේ දැනට පවතින සීමාවන් පහත පරිදි සංශෝධනය කිරීමටත්, ප.මු.රි. 34.2 (ඉ) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමටත් ගරු ආණ්ඩුකාරවර අනුමැතිය ලැබී ඇති බව ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක NWP/GOV/AD/11/15/වෙළුම II හා 2023.08.11 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත. එම නියමයන් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

| අනු අංකය | පැවති රීතිය | සංශෝධිත නව රීතිය |
|---|---|---|
| (අ) | මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් 10% දක්වා නමුත් රු.25,000/- නොඉක්මවන වැඩිවීමක් වන්නේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය. | මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් 10% දක්වා නමුත් රු. 500,000/- නොඉක්මවන වැඩිවීමක් වන්නේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය. |
| (ආ) | 20% දක්වා නමුත් රු.500,000/- නොඉක්මවන වැඩිවීමක් සිදුවන විට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය. | 20% දක්වා නමුත් රු.3,000,000/- නොඉක්මවන වැඩිවීමක් සිදුවන විට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය. |


අධ්‍යක්ෂ (මුදල් හා ආදායම්) / இயக்குனர் (நிதி மற்றும் வருவாய்) / Director (Finance & Revenue) — Tel : 037-2223332, Fax : 037-2223332, e-mail : dirafinrevnwpc@gmail.com

ප්‍රධාන ලේකම්කාර්යාලය / பிரதானசெயலாளர் அலுவலகம் / Chief Secretary's Office — Tel : 037-2231769-72, Fax : 037-2222234, e-mai : csnwp@sltnet.lk, Web site : www.cs.nw.gov.lk

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) / பிரதிப்பிரதானசெயலாளர் (நிதிமுகாமைத்துவம்) / Deputy Chief Secretary (Financial Managment) — Tel : 037-2228128, Fax : 037-2223731, e-mail : dcsfnnwpc@gmail.com, dcsfinance@nw.gov.lk

| | | |
|---|---|---|
| (ඇ) | 25% දක්වා නමුත් රු.2,500,000/- නොඉක්මවන විට ප්‍රධාන ලේකම්වරයාගේ හෝ පළාත් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකාරණ) අනුමැතිය. | 25% දක්වා නමුත් රු. 10,000,000/- නොඉක්මවන විට ප්‍රධාන ලේකම්වරයාගේ හෝ පළාත් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකාරණ) අනුමැතිය. |
| (ඈ) | රු.2,500,000/- ඉක්මවන කල්හි පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය. සමස්ථ පිරිවැය ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කිරීම පිණිස අධිකාර බලය ඉදිරිපත් කරන ඉල්ලීමක් සමග 3 වැනි පරිශිෂ්ඨයේ දක්වා ඇති ප්‍රකාර සැසඳුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. | රු.10,000,000/- ඉක්මවන කල්හි පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය. සමස්ථ පිරිවැය ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කිරීම පිණිස අධිකාර බලය ඉල්ලා ඉදිරිපත් කරන ඉල්ලීමක් සමග පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 3 වැනි පරිශිෂ්ඨයේ දක්වා ඇති ප්‍රකාර සැසඳුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. |

<u>**නව වගන්තිය**</u>

**ප.මු.රි. 34.2**

**(ඉ) මුළු පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ඉහත සීමාවන්ට යටත්ව රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ (Procurement Manual – Supplement – 14 සහ ඊට අදාලව පසුව කරන සංශෝධන) සඳහන් නියමයන් සුදුසු පරිදි අනුගමනය කළ යුතුය.**

ජී.ජී.සී.ප්‍රේමකුමාර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ)

අ/කළේ:-රංජිත් ආරියරත්න
ප්‍රධාන ලේකම් (වයඹ)

පිටපත: 1. සහකාර ප්‍රධාන ලේකම්, ආයතන - උක්ත ප.මු.රි.34 සංශෝධනය, ප්‍රධාන ලේකම් වෙබ් අඩවියේ (www.cs.nw.gov.lk) පළ කිරීම සඳහා